## සාදර සිහිකිරීමයි !

# සිරිසෝම හරිශ්චන්ද්‍ර මහතා



ලන්ඩනයේ විසූ ප්‍රවීන කවියෙකු හා ලේඛකයෙකු වන සිරිසෝම හරිශ්චන්ද්‍ර මහතා අභාවප්‍රාප්තව පසුගිය මස 17 වෙනි දිනට වසර 3 ක් පිරුණි. එතුමන්ගේ ගුණසමරා දූ පුතුන් ඇතුළු පවුලේ සියළු දෙනා විසින් පුණ්‍ය කටයුතු සිදු කරන ලදී.

**සිරිසෝම හරිශ්චන්ද්‍ර මැතිඳුන්ට නිවන් සුව අත්වේවා!**

# DR PIYADIGMA GAMAGE AMARAJEEWA

## දොස්තර අමරජීව මහතා (AGE 83)



**Beloved husband of late Mrs Sriya Amarajeewa, father of Anoma and Rohana Amarajeewa, expired on 31st December 2008. Cremation took place on Thursday, 8th January 2009 at Southgate Crematorium.**

**May He Attain Nibbana !**

***Residence*** **- 17 Cranleigh Road, London N15 3AB**
**Tel. 0208 802 5481**

# Mr Tissa Hapangamaarachchi

## තිස්ස හපන්ගමආරච්චි මහතා

(Formerly of the Sri Lanka High Commission in London)



**Beloved husband of Chitra Olivia, Mr Tissa Hapangamaarachchi passed away in London on 1st December 2008.**

**The funeral took place at the Hendon Crematorium, Holders Hill Road, London NW7 on Friday, 5th December 2008.**

**May he attain the supreme bliss of Nibbana!**

***Chitra would like to thank the venerable Maha Sangha, His Excellency, The High Commissioner of Sri Lanka, relatives and friends who attended the funeral, sent mesages of sympathy, made contributions to charity and helped in innumerable ways and regrets her inability to thank everyone individually.***

# ඊළම් රාජ්‍ය පිළිගන්න බෑ ඉන්දිය රජය තමිල්නාඩුවට කියයි

ශ්‍රීලංකාවේ සිටින ඉන්දියානු මහ කොමසාරිස් ආලෝක ප්‍රසාද් මහතා ඉවත්කර ද්‍රවිඩ ජාතිකයෙකු එම ධූරයට පත්කරන ලෙසත් වහාම ඊළාම් රාජ්‍යය පිළිගන්නා ලෙසත් පසුගිය 28 වෙනි දින තමිල්නාඩුවේ චෙන්නායි නුවර පැවති ඊළාම් සමුළුවේදී කළ ඉල්ලීම ඉන්දිය රජය විසින් ප්‍රතික්ෂෙප කර ඇත.


මෙම ඊළාම් සමුළුව සඳහා කොටි සංවිධානය නියෝජනය කරමින් කොටින් ගේ තිලකවියෙකු වූ කාසි ආනන්දන්, ද්‍රවිඩ ජාතික සංවිධානය වෙනුවෙන් එම්. කේ. සිවාජිලිංගම්ද, පී.එම්.කේ. පක්ෂයේ නායක පී. කේ. මානි ද ඇතුළු කොටි හිතවාදීන් සහභාගී වී තිබේ.

ශ්‍රීලංකා හමුදාව කිලිනොච්චිය සහ මුලතිව් අල්ලාගැනීමට ඉතා සමීප බවත්, එය වහාම වළක්වන ලෙසත් මෙම සමුළුවේදී ඉන්දියානු රජයෙන් ඔවුන් ඉල්ලීමක් කර ඇත.

# කිලිනොච්චි සහ මුලතිව් සිට 701 දෙනෙක් රජයේ පාලන ප්‍රදේශයට එති

කිලිනොච්චිය සහ මුලතිව් සිට ජනවාරි 1 වෙනිදා වන විට කොටින් විසින් රඳවා ගෙන සිටි පුද්ගලයින් 701 දෙනෙක් ඒ ග්‍රහණයෙන් මිදී රජයේ පාලන ප්‍රදේශයට පැමිණ සිටිති. එම පිරිස දැනට නවාතැන් ගෙන සිටින්නේ මැණික් පාම් ප්‍රදේශයේ තාවකාලික රැඳවුම් මධ්‍යස්ථාන වලය. ඔවුන් සඳහා තාවකාලික නිවාස 100 ක් මැණික්පාම් ප්‍රදේශය තුළ ඉදිකර ඇති අතර තවදුරටත් වන්නියේ සිට පැමිණෙන ජනතාව සඳහා පාසැල් දෙකක් ද රැඳවුම් මධ්‍යස්ථාන ලෙස යොදාගැන්මට පියවර ගෙන ඇත. අවතැන් ජනයාට අවශ්‍ය සුබ සාධන කටයුතු හා පිසූ ආහාර ලබාදීම දිස්ත්‍රික් ලේකම් මගින් සිදු කෙරේ. ඉදිරි සති කීපය තුළ තව විශාල පිරිසක් මෙසේ මේ පැත්තට ගලාඑනු ඇතැයි සුබසාධන නිලධාරීහු කියති.

## ♥ පැටියො ඩාලිං



පැටියො අර ආණ්ඩුවට පැනලා හිටි කරු ජයසූරිය මහත්තෙයා අන්න ආයි යූ ඇන් පී එකට පැනලා. එයා එහෙම කළේ රටට හරිහැටි සේවයක් කරන්නලු. ඒක අහලා ජනාධිපතිතුමා කිව්වලු ඒ පැත්තෙ තණකොළ ඉවරවුනාම පොර ආයිත් වැටෙන් රිංගලා මේ පැත්තට ඒවිය කියලා.


Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432
සැම්ස් චිකන්


# Sinhala Lesson 129 සිංහළ පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

### Causal Verb - ප්‍රයෝජ්‍ය ක්‍රියා

When we are making or causing another person to do an action, a verb-form called the **CAUSAL** or **ප්‍රයෝජ්‍ය ක්‍රියා** is used. This verb-form can be used as a finite verb and as participles. Suffixes like **ව, වි** are added to the root forms of the verb along with the participle as seen in the following sentences:

1. තාත්තා තම පුතා ලවා කතාවක් ලියවයි
   Father causes his son to write a story
2. තාත්තා තම පුතා ලවා කතාවක් ලියෙව්වේය
   Father caused his son to write a story
3. තාත්තා තම පුතා ලවා කතාවක් ලියවන්නේය
   Father will make his son to write a story

**In speaking Sinhala, the word කියලා is used instead of ලවා and the Causal verb takes a common form for all subjects in the sentences as in:**

තාත්තා පුතාට කියලා කතාවක් ලියවනවා.
තාත්තා පුතාට කියලා කතාවක් ලියෙව්වා
තාත්තා පුතාට කියලා කතාවක් ලියවාවි
මම/ අපි/ ඔබ/ ඒ අය වඩුවට කියලා පුටුවක් හදවනවා

Try to pick out Causal Verbs in your reading and conversation and use Causative Verbs in conversation.

♦ ආචාර්යා සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 105

| | | | | |
|---|---|---|---|---|
| 1 | | | ■ | 2 |
| | ■ | ■ | 3 | |
| 4 | 5 | ■ | 6 | |
| ■ | 7 | | ■ | |
| 8 | | ■ | 9 | |

**හරහට :**
1 මෙය කාන්තාවන්ගේ රූප සෝබාව වැඩිකරයි
3 වස්ත්‍රය.
4 ඉදිරි කාලය
6 පුළුස්සන දෙයකි
7 වැව් 8 ශරීරය
9 නැතුවම බැරි දෙයකි

**පහළට :**
1 දුටුගැමුණු රජතුමාගේ ගම
2 දැනගෙන ගියොත් යා හැක
3 කිසිවෙක් මේවාට කැමති නැත
5 එදිනෙදා පාවිච්චියට ගන්නා දෙයකි

***ගියවර නිවැරදි විසඳුම්***
**හරහට :** 1 හමුදාව 5 රත්නපුර 7 බතා 8 රට 9 කනක 10 මල්වාන
**පහළට :** 1 හරබර 2 මුත්තා 3 දාන 4 වපුරනවා 6 රටකන 9 කල්

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

# වම්බටු හා කරවල පැහි
# Aubergine and Dryfish Pehi

***අවශ්‍ය ද්‍රව්‍ය :***
ලොකු වම්බටු ගෙඩි 2 ක්
කුඩාවට කපාගත් කරවල කෑලි 10 ක්
ලොකු ළූනු ගෙඩි 2 ක්
ලොකු තක්කාලි ගෙඩි 2 ක්
සුදු ළූනු බික් 4 ක්
විනාකිරි තේ හැඳි 2 ක්
අබ කුඩු මේස හැඳි 1 ක්
කෑලි මිරිස් තේ හැඳි 1 ක්
ලුණු ඇති පමණ
බදින එළවළු තෙල්

***සාදන ක්‍රමය :*** වම්බටු සිහින් ව කුඩා කැබලි වලට කපා ගැඹුරු තෙලේ බැදගන්න. කරවල කෑලි ද වෙනම බැදගන්න. ඒ දෙවර්ගයම තෙල් බේරෙන්නට පසෙක තබන්න. සාස්පානකට මඳක් තෙල් දමා රත්වන විට ඊට සිහින්ව පෙති කැබූ ළූනු හා සුදුළූනු දමා බැදෙන්නට හරින්න. එය බැදගත් වම්බටු වලට දමා කළවම් කරන්න.

අබ කුඩු විනාකිරි හා කෑලිමිරිස් එකට අනා පාප්පයක් සාදා ගන්න. දැන් එය වම්බටු මිශ්‍රණයට දමා කරවලද ඊට දමා කළවම් කරන්න. තක්කාලි කුඩා හතරැස් කෑලිවලට කපා අවශ්‍ය නම් අමුමිරිස් කරල් දෙකතුනක්ද සිහින්ව කපා මෙයට එකතුකර හොඳින් මිශ්‍රකරගන්න.

♦ ***කමනී නිල්මිණී හෙන්දාවිතාරණ***
තලල්ල දකුණ Sri Lanka